# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2191/4 - 2020 අගෝස්තු මස 31 වැනි සඳුදා - 2020.08.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය : 4/2/1/94.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/2/2018/CEB/10.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාමළුව ගමේ අංක 401C, නාමළුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇති සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද මූ. පි. ගම්. 4207 දරන පිඹුරුපතේ සඳහන් නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබැල්ල:

**මූ. පි. ගම්. 4207 - කැබලි විස්තරය :**

**කැබලි අංක 1 -**
ඉඩමේ නම : හල්ගහවත්ත; විස්තරය : ගෙවත්ත; මුල් හිමිකම් කියන අය: එම්. ඩී. කුලරත්න, අංක 226, නාමළුව, දෙකටන; හිමිකම් කියන්නා : රජය; ප්‍රමාණය: හෙක්. 0.0127

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 දෙසැම්බර් මස 2 වැනි දින පූර්ව භාග 10.00 ට දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2020 නොවැම්බර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එන්. ඒ. ඒ. එස්. නිශ්ශංකආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2020 අගෝස්තු මස 26 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-324

---

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය : DEV/LND/02/ACQUI/04-25.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964


1A - G 32778 – 32 (2020/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කපුගම නැගෙනහිර ග්‍රාමනිලධාරි වසමේ, කපුගම ගමේ පිහිටි මාර/2839 දරන මූලික පිඹුරේ, කැබලි අංක 01 දරන ඉඩම් කොටස (ප්‍රමාණය හෙක්ටයාර් 0.8805ක් පමණ):

**කැබලි අංක 1**

ඉඩමේ නම : ගෙදරවත්ත *නොහොත්* ගාල්ලෙගෙදරවත්ත, ජුල්ගහකොරටුව *නොහොත්* ජුල්ගහවත්ත, ඉහලවත්ත; ප්‍රමාණය: හෙක්. 0.8805.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 සැප්තැම්බර් මස 24 දින පෙරවරු 10.00ට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2020 සැප්තැම්බර් මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කේ. පී. ජී. සුමිත් ශාන්ත,
අත්කර ගැනීමේ නිලධාරි/ප්‍රාදේශීය ලේකම් (*වැ. බ.*),
දෙවිනුවර.

2020 අගෝස්තු මස 19 වැනි දින,
දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-325

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : THI/LND/L2/ACQVI/136.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/9/2015/ws/297.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම්, උමේෂා සුරංගි මාතරගේ වන මම මාතර IV වන අදියර ජල යෝජනා ක්‍රම යටතේ හොරොන්දුව ජල කුළුණ හා ස්ථාන භාරකරු නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමට අදාළව නිකුත් කරන ලද 2020.02.24 දිනැති අංක 2164/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* 1A පිටුවෙහි ප්‍රකාශයට පත් කරන ලද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ *ගැසට් නිවේදනයේ* හිමිකම් පරීක්ෂණ දිනය 2020.09.23 දින ලෙසද, ඊට අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු දිනය 2020.09.16 දින ලෙසද සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

උමේෂා සුරංගි මාතරගේ,
ප්‍රාදේශීය ලේකම්,
තිහගොඩ.

2020 අගෝස්තු මස 25 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

09-326

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.